# CandleAid Lanka

**(Government Approved Charity – Reg.No.GA 201)**
**21/4, Dharmaratne Avenue, Rawathawatte, Moratuwa 10400, Sri Lanka.**
**Tel: +94 11 2642526 / Fax: +94 11 2642139**
**Email: admin@candleaid.org Website : www.candleaid.org**


18.12.2023

**ඉංග්‍රීසි ඉගෙන ගන්න ආපු ඔයාලා හැමෝටම...**



මම පියුමි නිසංසලා. මතුගම මීගහතැන්න කියන දුශ්කර ප්‍රදේශයේ තමයි මම ජීවත් වෙන්නෙ. අපේ ගමේ කිසිම කෙනෙක් ඉංග්‍රීසි කතා කරන්නෙ නෑ. මම උසස් අධ්‍යාපනය හදාරන්න පේරාදෙණිය කැම්පස් එකට ගියා. අවුරුදු 4ක් ඉඳලා උපාධිය ඉවර කරලා ආවා. ඒත් ඉංග්‍රීසි නම් කතා කරන්න බෑ.

දැන් මම මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන අතර එතනත් කිසිම කෙනෙක් ඉංග්‍රීසි කතා කරන්නෙ නෑ. කොටින්ම කිව්වොත් මට ඉංග්‍රීසි කතා කරන්න පරිසරයක් ඇත්තෙම නෑ. මේ අතරෙදි තමයි කැන්ඩ්ල් ඒඩ් ආයතනය පටන් ගත්තු අලුත්ම වැඩේ උන ඉංග්‍රීසි පාඨමාලාවට සහභාගි වෙන්න මටත් අවස්ථාවක් ලැබුනෙ. කැන්ඩ්ල් ඒඩ් ආයතනය මට ගොඩක්ම සමීපයි. අවුරුදු ගණනාවක් ඉඳලා මට ඉගෙන ගන්න උදව් කරපු ආයතනය. කැන්ඩ්ල් ඒඩ් ආයතනය කවදත් කරන්නෙ හොඳ දේවල්. ඉතින් ඒ විශ්වාසය මත මමත් මාස 3ක් වගේ කෙටි කාලයක් තිබුන මේ වැඩසටහනට සම්බන්ධ උනා.

මේ පාඨමාලාව ඇතුලෙ අපිට කරන්න තිබුනෙ බොහොම සුලු දේවල් ටිකක්. සතියකට වරක් එක රචනාවක් ලිව්වා. අපි අලුත් ඉංග්‍රීසි වචන 25ක් ලිව්වා. ඒ දෙක අපිට කියලා තීන වෙලාවටම අපි යවන්න ඕනෙ වට්ස්ඇප් හෝ ඊමේල් හරහා. ඒ වගේම අපිට දෙන ලද ඉංග්‍රීසි පොතක පිටු 05 ක් අපි සතියට කියවන්න ඕනෙ. ඊට අමතරව වැදගත්ම කොටස අපිට වෙන් කරලා තීන වෙලාව අදාල ටෝක් මේට් සමග අපි කතා කරලා, කතා කරේ කාත් එක්ක ද කොච්චර වෙලාවක් ද කියන එක කියලා යවන්නත් ඕනෙ අපේ පාඨමාලාවේ කෝඩිනේටර් වෙත.

ඉතින් මම ඔය කියපු වැඩ ටික මේ පාඨමාලාව තුළදි අපි කරන්න ඕනෙ. අපිට මෙතැනදී තියෙන්න ඕන වැදගත්ම දේ තමා කැපවීම. කැපවීම නැතුව මේ වැඩේ කරන්න බෑ. මම වැඩට යන ගමන් ගෙදර වැඩ කරන ගමන් මේ වැඩේට කැපවෙලා මහන්සියෙන් වෙලාවට වැඩ කරා. ඒ වැඩ වෙලාවට නොකෙරුවා නම් මාව මේ පාඨමාලාවෙන් අයින් කරනවා. ඒක තමා නීතිය. අපිට එක් වරක් පමණක් පැවරුමක් මග හැරීමට හැකි උනත් දෙවෙනිවර මග හැරියොත් පාඨමාලාවෙන් ඉවත් කරනවා. මෙහි නීති ඉතා දැඩි බව මතක තබා ගන්න.

කොහොමහරි උනන්දුවෙන්, කැපවීමෙන් මාස 3ක් මේ වැඩ ටික කරා. ඉංග්‍රීසියෙන් කතා කරන්න බයෙන් හිටපු මට දැන් ඕන කෙනෙක් එක්ක බය නැතුව ආත්ම විශ්වාසයෙන් ඉංග්‍රීසි කතා කරන්න පුලුවන්. ඒ මේ පාඨමාලාවට පිං සිද්ද වෙන්න. ඉංග්‍රීසි කතා කරන එක හීනයක් වෙලා තිබුන මට අද ඒ හීනෙ හැබෑ වෙලා. කිසි බයක් ලැජ්ජාවක් නෑ. අද ඕනම කෙනෙක් එක්ක මට ඉංග්‍රීසි කතා කරන්න පුලුවන්. ඇත්තටම ඒක ආශ්වර්යයක්. මාස 3ක් වගේ පුංචි කාලෙකින් අපේ අතින් සත පහක්වත් වියදම්

***"It is better by far to light a solitary candle than to curse the darkness"***

# CandleAid Lanka

**(Government Approved Charity – Reg.No.GA 201)**
**21/4, Dharmaratne Avenue, Rawathawatte, Moratuwa 10400, Sri Lanka.**
**Tel: +94 11 2642526 / Fax: +94 11 2642139**
**Email: admin@candleaid.org Website : www.candleaid.org**


නොවී ඉංග්‍රීසි ඉගෙන ගත්තා. ඒක මට මගේ ජීවිතේ ලැබුනු ලොකු අවස්ථාවක්. මම ඒ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනයක් ගත්තා කියලා මම හිතනවා. මේක හැමෝටම හම්බවෙන අවස්ථාවක් නොවන නිසා අපි ගොඩක් වාසනාවන්තයි.

ඒ විතරක් නෙමෙයි, මට දැන් ලංකාවෙ විතරක් නෙමෙයි, වෙනත් රටවලත් ඉංග්‍රීසි කතා කරන්න ටෝක් මේට්ස්ලා ඉන්නවා. ලංකාවේ මගේ ඒ කතා මිතුරන් මම හමුවෙලා පවා තිබෙනවා. ඔවුන් හරිම කරුණාවන්තයි, හරිම ආදරණීයයි. උදව් කරන්න හරිම කැමතියි. පාඨමාලාව ඉවර උනත් මම තාමත් එයාලා එක්ක ඉංග්‍රීසියෙන් කතා කරනවා. එයාලා දැන් මගේ හොඳම යාළුවො. එයාලගෙන් ගොඩක් දේවල් මන් ඉගෙන ගත්තා. ඉංග්‍රීසිවලට අමතරව බොහෝ දේවල්. ලෝකේ දිහා අලුත් ඇහැකින් බලන්න ඉගෙන ගත්තා කිව්වොත් නිවැරදියි.

ඉතින් ඔන්න ඕකයි කතන්දරේ. කැපවෙලා වැඩ ටික කරොත් ඔයාලටත් මන් වගේ ඉංග්‍රීසි කතා කරන්න පුලුවන්. ඒක මන් ඔප්පු කරලා ඉවරයි. ඉතින් විශ්වාසයෙන්, කැපවීමෙන් මේ පාඨමාලාවත් එක්ක එකතු වෙන්න. ඔයාලට පුලුවන් මේ අභියෝගය ජයගන්න. අපේ පාඨමාලා නියමු කැප්ටන් එල්මෝ ඔයාලව ලස්සන ගමනාන්තයකට ගෙන යාවි. එහෙනම් ඔයාලා හැමෝටම ජය ප්‍රාර්ථනා කරනවා.

ඔයාලට අවශ්‍ය නම් මට කතා කරන්න.

• 070 7760230 - **පියුමි**




*“It is better by far to light a solitary candle than to curse the darkness"*